4

THE SIGNALLER

SRI LANKA SIGNAL CORPS JOURNAL

2ND HALF 2000



2000.10.19 දින සංඥා බලකායට වසර 57 ක් පිරීම නිමිත්තෙන් ගෙන පැවැත්වූ නිලධාරි නිවසනයේ සාදයේ අවස්ථාවක්

2000.10.19 දින සංඥා බලකායට වසර 57 ක් පිරීම නිමිත්තෙන් ගෙන පැවැත්වූ සහ සැරයන් නිවසනයේ සාදයේ අවස්ථාවක්

2000.10.19 දින සංඥා බලකායට වසර 57 ක් පිරීම නිමිත්තෙන් ගෙන පැවැත්වූ සෙසු නිල භෝජනාගාරයේ පවත්වන ලද සාදය

THE SIGNALLER

සිව්වන කලාපය - ජූනි 2000

සංස්කාරක මණ්ඩලය

කර්නල් එස්ඒපීපී සමරසිංහ
ආර්එස්පී, පීඑස්සී
මේජර් ඩීආර් ධර්මසිරි
මේජර් ටීපී මනම්පේරි
මේජර් එම්පීජේඑස්කේ පටබැඳිගේ
කපිතාන් ජීඑල්එස්ඩබ් ලියනගේ

ලිපිනය

ප්‍රධාන සංස්කාරක
සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය
යුද හමුදා ජනපදය,
පනාගොඩ.
ටෙලි : 01-342818

සැකසුම හා මුද්‍රණය

සිල්වර්රීඩ් ඇසෝෂියේට්ස්
129, අරලිය ගොඩනැගිල්ල,
හයිලෙවල් පාර, මහරගම.
දුරකථන : 838999, 077 340776
ෆැක්ස් : 074 301023
ඊ-මේල් : silverreed@www.com

පටුන

සංවත්සර සැමරීම්	04-10
තාක්ෂණික දැනුම	11-14, 23-24
යුද්ධයේ ගිනිදැල්	15
පන්හිඳ	16-17, 25-26
මානව සම්පත් කළමණාකරණය	18-20
සංඥා කාන්තා සමාජය	21-22
පරිත්‍යාග	30
කෙලිබිම	31

කතුවැකිය

'ද සිග්නලර්' අර්ධ වාර්ෂික සඟරාවේ සංස්කාරක වශයෙන් කටයුතු කිරීමට අවස්ථාව ලැබීම මම ලද ගෞරවයක් සහ භාග්‍යයක් ලෙස සලකමි. 1998 වසරේ අවසාන භාගයෙන් ආරම්භ වී මෙම වසරේ නිකුත් වන සිව්වන කලාපය දක්වා මෙම සඟරාව පැමිණ ඇති කෙටි කාලය තුළ ලබා ඇති ප්‍රගතිය අතිමහත්ය. මෙය සංඥා බලකායේ සියළුම නිළයින්ට ආඩම්බර විය හැකි කරුණක් බැව් සිහිකිරීමට කැමැත්තෙමි.

මෙම සඟරාව තුළින් සංඥා බලකායේ කාලීන සිදුවීම් පිළිබඳ සියලුම නිළයින්ටත්, මෙය විශේෂයෙන් නවකයින් දැනුවත් කිරීමට හොඳ පිටිවහලක් වෙනවා මෙන්ම සංඥා ඒකක සහ ආයතනයන්හි රාජකාරි කරනු ලබන නිළයින්ගේ ලේඛන හා නිර්මාණ හැකියාවන් එළිදැක්වීමටත්, ඔවුන්ගේ එම හැකියාවන් වර්ධනය කරගෙන ඉදිරියට යෑමේ අවස්ථාව නිතැතින්ම ලැබෙන අතර, අනෙකුත් අයට එයින් යම් අවබෝධයක් ලබාගැනීමට හැකි වනු ඇත. මෙහි ඇතුළත් වන විශේෂ අධ්‍යාපනික ලිපි මගින් අප බලකායේ සැමටත් කෙසේ හෝ මෙම සඟරාව කියවීමට අවස්ථාව ලැබෙන අනෙකුත් හමුදා සාමාජිකයින් සැමගේ තාක්ෂණික දැනුම හා ඔවුන් නියැලී සිටින වෘත්තීය දැනුම බොහෝ සේ වර්ධනය කර ගැනීමට මහඟු අත්වැලක් වනු නොඅනුමානය.

තවද, පසුගිය කලාපයන්ට වඩා මෙම කලාපය සියලු සංඥා බලකා නිළයින්ගේ සංකල්පනාවක් අනුව මියගිය, අතුරුදහන් වූවන්ගේ නිවෙස්වල අයවලුන් ඉදිරිපත් කළ නිර්මාණ ඇතුළත් මෙම සඟරාව එළි දැක්වීමට කටයුතු කර ඇති හෙයින්, ඔවුන්ගේ චිත්ත ධෛර්යය යම් තරමකට හෝ වර්ධනය වනු ඇතැයි සිතමි.

අවසාන වශයෙන් සිව්වන කලාපය එළිදැක්වීමට මෙම අවස්ථාවේ සියලුම සංඥා නිළයින්ගෙන් හා එම පවුල්වල අයගෙන් ලද නිර්මාණශීලිත්වයත් මහඟු දායකත්වයත් ඉතා අගය කොට සලකන අතර, ඉදිරියේදීද මෙම සඟරාව එළිදැක්වීමේදී මෙලෙසම ඔබ සැමගේ සහය ලැබෙනු ඇතැයි මා නිසැකවම විශ්වාස කරමි.

ප්‍රධාන සංස්කාරක

YOUR CAP BADGE
THE ROYAL CORPS OF SIGNALS

The cap badge used by Royal Signal Corps

The cap badge used by Sri Lanka Signal Corps since 1972

Sri Lanka Signal Corp cap badge is designed from the Royal Signal Cap Badge. Therefor, it is important to know about the Cap Badge of Royal Signal.

The figure of mercury, messengers of the gods holds a winged staff or caducous in his left hand, his right held a loft, the stands poised on a globe by his left foot, the globe superimposed on a scroll inscribed with the corps motto *'Certa Cito'*, which could be literally translated as "reliable" information quickly but is popularly recognized as "Swift & Sure" The ensigned with a crown, detached from the rest of the badge. The mercury and globe are in white metal, the Crown & Scroll in gilding metal.

The design shown, with the St Edward's Crown has been worn since 1952 at first in metal, but since March 1955 in anodized materials. The same format with the Imperial Crown had been worn from 18th September, 1946, but the original badgeg adopted when corps was founded on 28th June 1920 had incorporated the figure of mercury and the globe in the white metal within an oval inscribed "Royal Corps of Signals", the oval surmounted by the imperial Crown and both in gilding metal.

Extracted from Wire Magazine
Royal Signal Corps



සංඥා බළකාධිපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් පළකරනු ලබන සඟරාවෙහි සිව්වන කලාපයට සංඥා බළකාධිපති වශයෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් සේ සළකමි.

මව්බිමේ ඒකීයභාවයත්, භෞමික අඛණ්ඩතාවයත් රැකගැනීමවස් උතුර/නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේනාංක සඳහා පාබළ හමුදා සමඟ උරෙන්උර ගැටී සංඥා සම්බන්ධතා සපයා දෙමින්, සංඥා බළකායේ නිළධාරීන් සහ සෙසු නිළයින් තම ජීවිත පරදුවට තබා සිදුකරනු ලබන සේවය ප්‍රසංශනී වේ. නොපසුබට උත්සාහයෙනුත් කැපවීම සහ නායකත්වයකින් යුතුව විද්‍යානුකූලව බළකායට අවශ්‍ය කාර්මික, තාක්ෂණික සහ යුධමය පුහුණුවීම නිසි පරිදි සිදුකිරීමෙන් අපගේ වෘත්තීයමය දක්ෂතාවයන් උපරිම මට්ටමකට ගෙනඒම අප සතු වගකීමකි. එම වෘත්තීයමය දැනුමත් සමාජයීය අවබෝධයත් ලබාදීමවස් පළකරනු ලබන මෙම අධ්‍යාපනික හා වාර්තාමය සඟරාව ඔබ සැමට ඉතා ඵලදායී වනු ඇතැයි යන්න මාගේ විශ්වාසයයි.

මෙම සඟරාව පළකිරීමේදී සෑම සංඥා රෙජිමේන්තුවකම සියළුම නිළයන්ගේ කැපවීම සහ සහය මෙම සඟරාවෙහි සාර්ථකත්වය සඳහා මහත් පිටිවහලක් වනු ඇතැයි අපේක්ෂා කරමි.

ගෙවීගිය කාලපරිච්ඡේදය තුළ මව්බිමේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය රැක ගැනීමට තම දේශය වෙනුවෙන් ආත්ම පරිත්‍යාගයෙන් යුතුව තම ජීවිතය පුදකළා වූ, බළකායේ සියළුම රණවිරුවන්ට ගෞරවනීය ලෙස මම ආචාර කරමි. එමෙන්ම, ක්‍රියාන්විතයේදී ආබාධිත වූ සියළුම රණවිරුවන් කඩිනමින් ප්‍රකෘති තත්ත්වයට පැමිණේවායි ප්‍රාර්ථනය කරමි.

මේ දක්වා ඔබ විසින් කරන උදාරතර සේවාව මින් ඉදිරියටත් නොඅඩුව, නොපිරිහෙලා ලබාදීම පිණිස විනය, නායකත්වය, කැපවීම, චිත්ත ධෛර්යය යන මූලධර්ම වර්ධනය කර ගනිමින් අපගේ වෘත්තියට අදාලව ලබාගන්නා ලද මනා පුහුණුව තුළින් හමුදා සම්ප්‍රදායන්ට අනුකූලව කටයුතු කිරීමට ඔබ සියළු දෙනාම අදිටන් කර ගනු ඇතැයි මම විශ්වාස කරමි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා සංඥා බළකායේ සියළුම නිළධාරීන් හා සෙසු නිළයින් හට හා එම පවුල්වල අය ඇතුළු සිවිල් අයවළුවන්ටත් සාමයෙන් යුත් සමෘධිමත් අනාගතයක් උදාවේවායි මා ඉතසිතින් ප්‍රාර්ථනය කරමි.

කේජේඑන් සේනවීර ආර්එස්පී යූඑස්පී එල්ඩීඑම්සී
බ්‍රිගේඩියර්
බළකාධිපති

සංවත්සර සැමරීම

3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය 11 වන උපන්දිනය සැමරූ වගයි

3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය සංඥා පවුලේ තෙවෙනියා ලෙස ශ්‍රී ලංකා භූමි තලයේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය සඳහා ආදර්ශමත්ව වගකීම් සහගතව විශාල රාජකාරීන් සමූහයකට උරදෙමින් සිය 11 වන සංවත්සරය 2000 මාර්තු මස 09 දින ශ්‍රී ලංකාද්වීපයේ හෙළ රජදරුවන්ගේ රාජධානිය වූ ඉපැරණි අනුරපුර දී සමරණු ලැබීය.

ඉතාමත් කාර්ය බහුල අවදියක වුවද අර්ථවත් අන්දමින් සහ චාම් බාවයකින් 11 වන සංවත්සරය සැමරීමට ඒකකය තීරණය කරන ලදී. මෙවරත් සංවත්සර උත්සවය ආරම්භ කරන ලද්දේ සාලියපුර වැඩිහිටි නිවාසය සුද්දපවිත්‍ර කොට පිරිසිදු කිරීමෙන් අනතුරුවයි. දෙවනුව ශ්‍රී ලංකා භූමි තලයේ සාමය උදෙසා උදාරතර සේවයක් කර තම ජීවිතය පරදුවට තැබූ ඒකකයේ සියළුම රණවිරුවන්ට හා ඔවුන්ගේ පවුල්වල අයටත්, සේවයේ යෙදී සිටියදී අබාධිත වූ සෙබලුන්ටත් සේවයේ නියුතු සියළුම සෙබලුන් ඇතුළු පවුලේ සැමටත් සෙත්පතා ජයශ්‍රී මහා බෝ සමිදු ඉදිරිපිට 2000.03.04 දින ආශිර්වාද සෙත්පැතීමේ පිංකමක්ද පවත්වන ලදී. මෙහිදී අප ඒකකයේ සේවයේ යෙදී සිටියදී මියගිය සෙබළ සොහොයුරන්ගේ දෙමාපියන් ද සහභාගි කරගැනීමට අමතක නොකළෙමු. සෙත් පැතීමේ පිංකමෙන් අනතුරුව එම ඥාති පිරිස අනුරපුරයේ ඉපැරණි සිද්ධස්ථාන වැඳපුදා ගැනීම සඳහා සහභාගි කරවන ලදී. ඉන් අනතුරුව එම ඥාති පිරිස අණදෙන නිළධාරිතුමා සමග සුහද හමුවීමකට සහභාගිවන ලදී. මෙහිදී ඔවුන්ගේ ප්‍රශ්න සාකච්ඡා කරන ලද අතර අඩුපාඩුකම් හා මේ දක්වා ඔවුන්වෙත ඉටුකිරීමට තිබූ සුබසාධක මට්ටමේ කරුණු කාරණා ගැනද කතිකාකළ අතර ඔවුන් වෙත ඉටු කිරීමට තිබූ ප්‍රශ්න රාශියකට විසඳුම් ලබා දී තිබූ බව මෙහිදී මහත් සතුටට කරුණකි. මෙහිදී අප රණ විරුවන් වෙත හිමිගන්වා තිබූ පදක්කම් පිරිනැමීමද විශේෂ සිදුවීමක් වූ අතර රණවිරුවන්ගේ දූ දරුවන් වෙත ත්‍යාග පාර්සල් බෙදාදීම අණදෙන නිලධාරී තුමාගේ සුරතින් සිදුකරන ලද අතර මෙම 11 වන සංවත්සරයට සහභාගි වූ සියලුම රණවිරුවන්ගේ එක් පවුලකට ගමන් වියදම් වශයෙන් රු. 500.00 බැගින් ප්‍රදානය කරන ලදී. ඉන් අනතුරුව අණදෙනු නිලධාරීතුමා ප්‍රධාන සියලුම නිලධාරීන් සහ සෙසු නිලධාරීන් ද ඒ වගේම අප සහෝදර රණවිරුවන්ගේ පවුල්වල ඥාති පිරිස ද එක්ව අනුරපුර අඳ, ගොළු, බිහිරි පාසල වෙත ගොස් එහි ඉගනුම ලබන සියළුම ළමයින් වෙත දානය පිලිගන්වා ත්‍යාග පාර්සලයක් බැගින් පිරිනැමීමට ද අමතක නොකළෙමු.

මෙම දිනවලම ඒකකය තුළ අන්තර් බලඝන අතර අත්පන්දු හා පාපන්දු, එල්ලේ ක්‍රිකට් තරග පුහුණු අංශයද ජයග්‍රහනෑ වාර්තා කරන ලදී.

2000.03.09 වන දින උදෑසන පළමුවෙන්ම සංඝයා වහන්සේලා රෙජිමේන්තු මූලස්ථානයට වඩම්මවා සෙත් පිරිත් සජ්ඣායනාවක් පවත්වා ඒකකයේ අණදෙන නිළධාරිතුමා හට සම්මාන මුරයක් සහිතව සම්මාන පෙළපාලිය පිලිගන්වන ලදී. ඉන් පසු සියළුම නිළයින් සහභාගි වූ දිවා භෝජන සංග්‍රහයද පවත්වන්නට යෙදිණි. සන්ධ්‍යා කාලය තුළ නියමිතව තිබුණේ ඒකක පවුල් දිනය සහ සියළුම නිළයින් සහභාගිවන සුහද හමුවයි. ඒකක භූමි පෙදෙසේ මෙය සුදානම් කර තිබූ අතර සන්ධ්‍යා කාලය එළඹෙත්ම කාලගුණය අයහපත් වී තද වැසි සුළං සහිතව ස්වභාවධර්මයා අපට හරස් වන්නට වුවද අප ඒකකයේ සෙබළුන්ගේ උපරිම ශක්තිය හා කැපවීම මත නැවත එම අංගයන් එලෙසම පවත්වාගෙන යාමට සමත් වීමු. අණදෙන නිළධාරිතුමාගේ ප්‍රධානත්වයෙන් ඒකක පවුල් දිනය සහ සුහද හමුව ආරම්භ කරන්නට යෙදුන අතර දූ දරුවන් සඳහා ක්‍රීඩා රාශියක්ම සංවිධානය කර තිබූ අතර එම ජයග්‍රාහකයින්ට ත්‍යාගද පිරිනමන ලදී. මෙහිදී 3 ශ්‍රීලංසංබ බීකන්ස්

THE IMPACT OF HIGH TECHNOLOGY ON MILITARY COMMUNICATIONS

BY Maj. GEN (Rtd) W J T K Fernando MIEE, MIERE, MBIM, psc, te

INTRODUCTION

In any theatre of war, a commander must be able to command and control his forces so that his fighting assets are optimized. Historically a clear dividing line was drawn between Command Control and Communications and all kinds of weapon systems. In a modern battle, movement of weapon systems is fast, which means that reactions must be equally fast. Such speed can only be achieved if commands are passed swiftly to the elements under the commander's control through effective communications channels. Communications therefore have always, played a key role on the battlefield, whether it was the advanced flag signals of Ghengis Khan or Desert Storm's Super High frequency digital satellite links.

From the beginning of warfare communication served basic functions :

* Convey orders to subordinates
* Convey information to superiors
* Control supporting efforts.

MILITARY COMMUNICATIONS SCENARIO

The Physical logistic and force protection requirements dictate a hierarchial military structure, as does information management. A single individual is not able to completely manage all details of a major operation. Therefore a structure was found to be necessary to provide filters and to share the effort, while remaining under a single unifying command.

To meet the information management scenario two communications systems evolved.

a. Combat Net Radio

b. Trunk Communications Systems

Combat Net Radio - Combat net radio, where a unit linked to its sub-units, formations linked to units command, etc, was and still is the primary means of command in the forward battle area. It has what it is normally described as an "all round capability". This means that when one station transmits a message, it is received by all other stations on the net. Combat net radio uses a single frequency way of operating known as simplex. These nets can be operated using HF. VHF and UHF the selection depending on the range of operation and the availability of frequencies.

Trunk Communication - Trunk Communication link headquarters together and provide the greater part of the communications that information commanders and staff need. Trunk Communications are complementary to the highly mobile and flexible net radio systems used by the fighting troops.

Calls made from on echelon of a headquarters to another and calls out of headquarters are made via trunk circuits. Since subscribers do not all make calls out of the headquarters at the same time, fewer trunk circuits are required to provide an adequate service. These common user trunk circuits are available to all subscribers within the headquarters. These circuits provide facilities for the transmission of video, fax, data as well as voice traffic.

LIMITATIONS OF NET RADIO

The limitations of net radio override the only advantage this system has the general information of the state of the battle being available to all users of the net.

* The message may not be of interest to all listening on the net.
* Transmissions can only take place in one direction at a time.
* Only one transmitter can be on the net at any given time.
* At least one frequency is required for each net.
* A commander cannot monitor all nets with out having a dedicated radio for each net.
* In a theatre of operations, the number of frequencies (a rare commodity) required to run all nets is quite large.
* The enemy can listen to all messages being transmitted if they are not encrypted.

LIMITATIONS IN TRUNK COMMUNICATIONS

One of the major limitations of a military trunk communications system is its necessity to follow the chain of command, with the communications equipment located in or near the headquarters. A large communications node close to tactical head-

quarters created serious problems. The conflicting requirementds of the two roles resulted in serious difficulties in sitting the headquarters complex. The sheer size of the complex, enhanced these difficulties due to the problems of both visual and divorcing the tactical and nodal communications roles of the headquarters. This was achieved by moving the long haul or trunk radio equipment to a separate communications centre to which the headquarters had access via short links.

Monumental changes to fighting methods and communication ability occurred in the last fifty years. However, the same organization and communication structure has remained.

THE USE OF DIGITAL TECHNOLOGY FOR MILITARY COMMUNICATIONS

In the commercial sector. Compact Disk (CD's) replaced phonograph records because digital technology inherently rejects noise whereas analogue technology inherently retains it. This change in the fundamental nature of recording fuelled a revolution in the music industry. So too can digital technology revolutionize military communication not only rejects noise, it also can be digitally controlled. Digital system reduce both noise and human operators can be shifted to digital control systems, freeing the operators for tasks that require more thought.

In addition to providing clearer, reliable communication, digital technology also contains the capability to more efficiently use allocated frequency bandwidth. Most communication equipment uses the same amount of frequency bandwidth that it did fifty years ago. In other words, even though existing circuits provide clearer, secure communication equipment uses the same amount of frequency bandwidth that it did fifty years ago. In other words, even though existing circuits provide clearer, secure communication, it uses the existing frequency spectrum inefficiently. Nearly all existing communication equipment must be assigned a particular band of frequency that remains dedicated to the equipment even when not in use. Even a digital system can have this limitation unless it is designed to allow other transmitters to share the bandwidth.

Digital communication can change the basic conduct of war. However, in the near term it may make the communication structure more able to fit Anti-Terrorist Operations (ATO). In ATO scenarios, small teams operating under a large organization may require access to high levels of command or may be widely separated from the main body of the force. In these situations digital communication can create ad hoc communication structures that allow a commander to customize the command without major equipment changes.

Digital communication, supported by trunking and satellite networks, can add flexibility and coverage to the military communication structure. New near earth satellites use capabilities developed for cellular phones to provide true global coverage. The new systems allow a single soldier to carry some of the communication abilities previously held at much higher levels of command. These new abilities may allow smaller teams to use fire control and coordination functions now performed at higher levels. Having the ability to use indirect fire may allow smaller teams to perform both infiltration type missions yet bring massed firepower when necessary. Communication advances may not change the conduct of war, but the advances fill in the communication necessary when a single soldier can affect the course of a nation.

Military Communications receive criticism about each new communication system being too hard general use and therefore requiring specially trained personnel. Using commercial technology, making the encryption transparent to the operator, and automating the routing of messages can reduce training and dedicated communication personnel. Digital communication techniques allow the system itself the ability to route traffic, find alternate routes and handle priority with less operator intervention.

Trained communication operators will always be necessary to establish command posts, key nodes and ground communications. Wide use of commercial equipment will reduce the need for special operator training/new recruits will arrive with a basic knowledge of computers and cellular telephones. Commercial telecommunication companies have a worldwide focus and several established worldwide communication satellite networks available for use, The military is a small communication user and therefore, by using compatible technology, can capitalize on the fact that a large market driver a lower per unit cost. The added benefit is that the planned growth room built into the oncoming systems will provide more capacity for contingency operations.

සංගීත කණ්ඩායමේ මයුර සත්සර රාවයෙන්ද සෙබලුන්ගේ මන්මද රංගනයෙන්ද ඒකක භූමි පෙදෙසම රසවත් වී ඒකාලෝක විය.

පුරා වසර 11 ක් වැනි කෙටි කාලයක් තුළ දී 3 වන සංඥා රෙජිමේන්තුව ලබා ඇති සීඝ්‍ර දියුණුව අතිමහත්ය. අනුරාධපුර නගරයේ ඇති දර්ශනීයම ක්‍රීඩාංගනයකින් සහ දැනට වැඩ අවසන් වෙමින් පවතින තේජාන්විත නව රෙජිමේන්තු ගොඩනැගිල්ලකින් සමන්විත ඒකක භූමිය 3 වන සංඥා මෑණියන්ගේ දරුවන් වන අපගේ සිත් ආඩම්බරයෙන් හා ගෞරවයෙන් මුසපත් කරවයි.

තම ජීවිත පරදුවට තැබූ 3 වන සංඥා බලකා නිළධාරීන් සහ සෙසුනිළයින්ගේ ලෙයින් සහ කඳුලින් ද 11 වසරක් පුරා පැහැදිලි මාර්ගෝපදේශකත්වයක් හා නායකත්වයක් ලබා දුන් සියළුම අණදෙන නිළධාරීන් සහ නිළධාරීවරුන්ගේ සාර්ථක අඩිතාලමක් මත සියළු සෙසු නිළයින්ගේ අප්‍රතිහත ධෛර්යයෙන් සහ ඩහදියෙන් ද ස්වයංපෝෂිත වූ 3 වන සංඥා රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය දිනෙන් දින දියුණු වෙමින් අර්ථවත් සහ පැහැබර හෙට දිනකට පියනගන බව ඉතාමත් සතුටින් සඳහන් කරමු.

11 වන සංවත්සරය වෙනුවෙන් ආගමික වතාවත් සිදුකිරීම

11 වන සංවත්සරයේදි මියගිය රණවිරුවන්ට හිමි පදක්කම් ඔවුන්ගේ ළඟම ඥාතීන් වෙත පිළිගැන්වීම

11 වන සංවත්සරයේ සම්මාන පෙළපාලිය අණදෙන නිළධාරිතුමා විසින් පරීක්ෂා කිරීම



11 වන සංවත්සරයේ පවුල් දින උත්සවයේදී කුඩා දූ දරුවන් බැලුන් පිපිරවීමේ තරගයට සහභාගී වී

11 වන සංවත්සරයේ සියළු නිළයින්ගේ සුහද හමුව

4 ශ්‍රීලංසංබ සංවත්සරය

ශ්‍රී ලංකා සංඥා බලකායේ 4 වන සංඥා රෙජිමේන්තුව වර්ෂ 2000 ක් වූ ජූනි මස 05 දින සිය අභිමානවත් 9 වන සංවත්සරය ඉතා චාම් අන්දමින් සමරණ්නට විය.

1991 ජූනි මස 05 වන දින යුධ හමුදා ජනපදය පනාගොඩහිදී ජනිත වූ 4 ශ්‍රීලංසංබ කුමරු මහනුවර, මඩකලපුව, පනාගොඩ හා යාපනය යන යුධ හමුදා සේනාංක හා බලසේනා ස්ථාපිත ප්‍රදේශයන්හි කෙළිලොල් කුමර කාලය ගෙවමින් යෙහෙන් වැඩෙන්නට විය. මෙසේ සංඥා සම්බන්ධතාවයෙහිලා රණශූරත්වයට පත් මෙම රෙජිමේන්තුව කාලීනව ශ්‍රී ලංකා යුධ හමුදාව මුහුණදෙන අති බැරෑරුම් අවිනිශ්චිත රණබිමට එඩිතරව උරදෙනුවස් මුළු මහත් යාපනය අර්ධද්වීපයෙහිම සංඥා සම්බන්ධතාවය පවත්වා ගැනීමේ භාරදූර කර්තව්‍ය අභීතව භාර ගනිමින් 1999.05.01 දින ආරක්ෂක සේනා මූලස්ථානය යාපනය යටතේ ස්ථිර සංඥා සම්බන්ධතාවයද පවත්වන්නට විය.

ඒ වනවිට නොයෙකුත් තාක්ෂණික සංඥා උපකරණ ආදියෙන් පරිපූර්ණව සිටි මෙම රෙජිමේන්තුව ඉතා ඉහල මට්ටමක සංඥා සම්බන්ධතාවයක් ගොඩනගා තිබුනද, යුධ හමුදා ඉතිහාසයේ සුවිශේෂ පිටුවක් පෙරලමින් 2000 අප්‍රේල් මස 20, 21, 22 යන දිනයන්හි ඊලාම් යුද්ධයේ උපක්‍රමික සන්ධිස්ථානයක් .වන අලිමංකඩ ප්‍රදේශය ආශ්‍රිතව ස්ථානගතව සිටි 54 වන සේනාංකය යුධ උපක්‍රමිකව පසුබැසීමේදී අතිවිශාල සංඥා උපකරණ ප්‍රමාණයක් නැතිවීම්/අලාභහානිවීම්වලට ලක්වීමෙන් පසුවද ඉතා සුළු ප්‍රමාණයක් වූ ඉතිරි සංඥා උපකරණ උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගනිමින් තවදුරටත් යාපනය අර්ධද්වීපයේ ක්‍රියාන්විත රාජකාරීන්හි නිරතව සිටින සේනාංක 04 කටද, බලසේනා 18 කටද, උපක්‍රමික ආධාරක බලසේනා මූලයන්ටද, බළඇණි වශයෙන් ගත්කල බළඇණි 51 කටද අඛණ්ඩ සංඥා පහසුකම් සපයමින් සිටීම හේතුවෙන් රණබිමේ මේසා විශාල භට පිරිසකට එකවර සංඥා සම්බන්ධතාවය පවත්වන එකම සංඥා රෙජිමේන්තුව බවටද පත්වී තිබෙන බව සාඩම්බරයෙන් යුතුව සිහිපත් කරවමු.

අලිමංකඩ සිදුවීමත් සමග උත්සන්න වූ යුධ වාතාවරණය හේතුකොට ගෙන මෙම රෙජිමේන්තුව නොයෙකුත් අපහසුතාවයන්හට මුහුණපෑමට සිදුවිය. 1 වන හා 3 වන සංඥා රෙජිමේන්තු ඉදිරිපත්වී සහෝදරත්වය පෙරදැරිව ලබාදුන් අපිරිමිත සහයෝගය ඒ අපහසුතා සියල්ල මගහැරවීමට බෙහෙවින් ඉවහල් වූ බැව් කෘතඥතා පූර්වකව සඳහන් කරන අතරම සංඥා බලසේනා මූලස්ථානය වෙතින්ද, සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙතින්ද, සංඥා මූලික වැඩපල වෙතින්ද ඉටුවූ සේවය බෙහෙවින් අගය කළයුතුවේ.

ආරම්භයේ සිට මේ දක්වා කාලය තුළ අණදෙන නිළධාරින් 08 දෙනෙකු යටතේ ක්‍රියාත්මක වෙමින් සංවර්ධනය වූ මෙම රෙජිමේන්තුව වර්තමාන 9 වන අණදෙන නිළධාරි මේජර් ජේවන් වික්‍රමාරච්චි යටතේද ප්‍රතිසංවර්ධනය වෙමින් නව යුගයකට පා තබා ඇත. මෙම වකවානුව තුළ සිදුවූ විශේෂ සිද්ධීන් වශයෙන් පසුමූලය හැර 4 ශ්‍රීලංසංබ මුළුමනින්ම පලාලි වෙත රැගෙන ඒම, යාපනය අර්ධද්වීපයේ භාවිතාවන සංඥා උපකරණවල සේවා හා අළුත්වැඩියා කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකිරීම සඳහා පහසුකම් රැසකින් සමන්විත සංඥාවැඩපලක් පලාලි හි ස්ථාපනය කිරීම හා ඒකකය තුළ ක්‍රීඩා භූමියක් ඉදිකිරීම හැඳින්විය හැකි අතර, ඉදිරි කාලය තුළ ක්‍රියාත්මක කිරීම පිණිස කාලෝචිත ව්‍යාපෘති රැසක් සැලසුම්කොට තිබේ.

තවද, ඒකකයට මනා ප්‍රතිරූපයක් ගොඩනගමින් ඒකක සරඹ භූමිය, නිළධාරි නිවස්නය, බනි/සැරයන් නිවස්ථය, කොනොනි සමාජ ශාලාව, සෙසුනිළ භෝජනාගරය හා ප්‍රධාන මුළුතැන් ගෙය සැලකිය යුතු තත්ත්වයකට ගෙනවිත් ඇති අතර ඒකකයේ සියළුම අයවළුන් හට ප්‍රයෝජනවත් වනසේ විහාරය, ජන අවන්හල, බේකරිය, පුස්තකාලය හා කරණවෑම් පහසුකම් උසස් මට්ටමකට පත් කොට තිබේ. මෙවන් වකවානුවක එවන් පහසුකම් රැසක් ලබාදෙමින් ඒකකයේ ජීවන තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒමට හැකිවීම ඒකකයේ සැවොම ලත් භාග්‍යයක් සේ සැලකිය හැකිය.'

වර්තමාන යුධ වාතාවරණය තුළ සිය නමවන වියට පාත තැබූ මෙම රෙජිමේන්තුව හට එය අති උත්කර්ෂවත් අන්දමින් සැමරීමට නොහැකි තත්ත්වයක් උද්ගත වූවද පශ්චාත් කාලසීමාව තුළ මෙම රෙජිමේන්තුවේ සේවය කරමින් මව්බිම සුරැකීමේ උදාර චේතනාව පෙරදැරිව සටන් වැද අප අතරින් සමුගත් සියළුම නිළධාරීන් හා සෙසු නිළයන්ටත් සියළුම අයවළුන්ගේ පවුල්වල මියගිය ඥාති මිත්‍රාදීන්ටත් සටනේදී තුවාල ලත් සියළුම නිළයන්ටත් සේවයේ යෙදී සිටින සියළුම රණවිරුන්ට හා ලක්වැසි සැමටත් පිං පැමිණවීම හා සෙත් පැතීම අරමුණු කරගත් සුමධුර ධර්මදේශනා සහිත බෝධිපූජාමය පිංකමක් 2000 ජූනි මස 05 වන දින පනාගොඩ බෝධිරාජාරාමයේදී අණදෙන නිළධාරීන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන්නට යෙදුන අතර ඊට සමගාමීව පලාලි ඒකක විහාරය අභියසද උප අණ දෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් බෝධි පූජාමය පිංකමක් පවත්වන්නට විය. එසේම ඒකකයේ සුබසාධන කටයුතු තවදුරටත් නංවාලනු වස් ඊට ආධාර පිණිස දික්තල හා කාලගෝල වේදිකා නාට්‍යය 2000 මැයි මස 20 වන දින ජෝන් ද සිල්වා සමරු රඟහලේදී රඟ දක්වන්නට විය.

මෙවැනි කටයුතු සඳහා මෙම ඒකකයේ මියගිය අයවළුන්ගේ ඥාතී මිත්‍රාදීන් කැඳවා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වීම සබැඳිව බෙහෙවින් කණගාටුවට පත් වන අතර සාමකාමී ඉදිරි කාලයක් තුළදී එම සියළුම අයවළුන් කැඳවා නිසි පිළිවෙත් ඉටු කිරීම ඒකකයේ බලාපොරොත්තුව වේ.

9 වන සංවත්සරය සමරණ මොහොතේ මෙම රෙජිමේන්තුවෙහි උන්නතියට මෙන්ම නොයෙක් කටයුතුවලදී නන් අයුරින් සහය දුන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ හා සිවිල් ආයතනවල සියළුම අයවලුන්ටද අපගේ හෘදයාංගම ස්තූතිය හා කෘතඥතාවය පිළිගන්වනු ලබන අතර අපගේ ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ද ඒ සැමගේ සහයෝගය ගෞරවයෙන් අපේක්ෂා කරමු.

රට දැය සුරැකීමේ උදාර මෙහෙවරින් මෙම රෙජිමේන්තුවේ උන්නතියට කැපව සටනේදී දිවිපිදූ සියළුම නිළයින් හිරු නැග එන මොහොතේදීත් හිරු බැසයන මොහොතේත් හදපිරි භක්තියෙන් හා ගෞරවයෙන් යුතුව සිහිපත් කරනු ලබන අතර සියළුම නිළයින්ගේ අමිල වූ සේවයෙන් 4 වන සංඥා රෙජිමේන්තුවේ ඉදිරිමග නිසැක ජය අත්වේවා යයි පහන් සිහිවිලි අවදි කරවමු.

ලුතිනන් අනුරාධ මෙන්ඩිස්
විධායක අධිකාරි - 4 ශ්‍රීලංසංබ

6 ශ්‍රීලංසංබ ආධාරක බලඇණියේ තෙවන සංවත්සරය

6 ශ්‍රීලංසංබ ආධාරක බලඇණිය පිහිටුවා 2000.01.10 දිනට තෙවන වසර හමාර කොට සිව්වන වසරට පාතබන ලදී. තෙවන සංවත්සරය 2000.01.10 වෙනි දිනට යෙදී තිබූ අතර එම සංවත්සරය නිමිතිකොට ගෙන පළමු අදියර ලෙස මෙම බලඇණියේ සේවය කරමින් සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මියගිය/අතුරුදහන් රණවිරුවන්ගේ ළඟම ඥාතීන් අනුරාධපුර ශ්‍රී මහා බෝධිය අභියසට ගෙන්වා අටමස්ථාන වන්දනාවෙන්, බෝධිපූජා ඇතුළු දානමය පිංකම් රාශියකට 2000.01.03 සහ 04 යන දෙදින තුළ පවත්වන ලදී. එකී අවස්ථාවේදී මියගිය/අතුරුදහන් අයවළුන්ගේ ළඟම ඥාතීන්ගෙන් තොරතුරු විමසා ඔවුන් වෙත යුධ හමුදාව වෙතින් ලැබිය යුතු හිමිකම් සොයාබලන ලදී. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකර ඔවුන්ගේ හිමිකම් ලබාදීමට කටයුතු කර ඇත. මෙම අවස්ථාවේදී අතුරුදහන් වූ සෙනින් දෙදෙනෙකු වෙනුවෙන් එක් අයෙකුට රු. 50,000.00 බැගින් ළඟම ඥාතීන් වෙත සංඥාරෙම මරණාධාර අරමුදලින් හිමි මරණාධාර පරිත්‍යාග භාරදෙන ලදී.



අතුරුදහන් වූ රණවිරුවකුගේ ළඟම ඥාතියකු හට රු. 50,000/- ක රෙජිමේන්තු මරණාධාර මුදල් පරිත්‍යාග කිරීම

ශ්‍රී මහා බෝධිය අභියස පැවති පිංකම් මාලාව

1. පසුව සංවත්සර දිනයේදී එවකට පැවති ක්‍රියාන්විත වාතාවරණය මත අණදෙන නිළධාරි වෙත සම්මාන පෙළපාළියක් නොපවත්වා සම්මාන මුරයක් ලබාදී බළඇණියේ සියළුම නිළයේ අයවළුන් වෙත දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදී. පසුගිය වසර තුළ මෙම බළඇණිය වෙතින් අනුපමේය සේවයක් ඉටුකර ඇත. මන්නාරම නගර කඳවුරේ සිට සිවිල් ද්‍රවිඩ වැසියන්ගේ ගමනාගමන පහසුකම් - භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා අදාල පරිදි අවසරපත් නිකුත් කිරීම් හා මන්නාරම නගරය වටා ආරක්ෂාව සපයමින් ඔවුන්ගේ සිත් දිනාගෙන රාජකාරි කරමින් සිටියදී. ක්ෂණිකව එම රාජකාරිවලින් මිදී ක්‍රියාන්විත රාජකාරීන් සඳහා පෙරියමඩු ප්‍රදේශයේ ඉදිරි දැඩි ආරක්ෂක වලල්ලේ රාජකාරි සඳහා ස්ථානගතවන ලදී. ඉන් පසු කෙටි කාලයක් තුළ විටින් විට ක්‍රියාන්විත හේතුන් මත වෙනත් වෙනත් ස්ථානයන් හි ස්ථානගත කිරීම් සිදුකරන ලදී. පසුව පාප්පමොඩේ ඉදිරි දැඩි ආරක්ෂක වලල්ලේ රාජකාරියේ නිරතව සිටියදී 1999.11.20 සහ 21 දිනයන්හිදී ත්‍රස්තවාදී ප්‍රහාර මධ්‍යයේ දින දෙකක් ප්‍රතිප්‍රහාර එල්ල කරමින් රාජකාරි යෙදී සිට ත්‍රස්තවාදී ප්‍රහාර උත්සන්නවීමේ හේතුවෙන් උපක්‍රමිකව පසුබැසීමෙන් අනතුරුව කුයිලන්කුලම ප්‍රදේශයේ නැවත ස්ථානගතවන ලදී. එම ස්ථානයද ත්‍රස්තවාදීන්ගේ ගමන් මාර්ගවල සන්ධිස්ථානයක් වී තිබුණි.

2. මෙම කඳවුරේදී තෙවන සංවත්සරය සමරා නොබෝදිනක් ගිය පසු 2000.01.18 දින අණදෙන නිළධාරිව සිටි ලුතිනන් කර්නල් ඒඒ පෙරේරා අණදීමෙන් සමුගන්නා ලදී.

3. ඉන්පසු එදින සිට නව අණදෙන නිළධාරී වශයෙන් ලුතිනන් කර්නල් ඩබ්පියූ චන්ද්‍රසිරි පත්ව එන ලදී. එම අවස්ථාව වනවිට ත්‍රස්ත ක්‍රියාකාරකම් බහුල ප්‍රදේශයක ඔවුන්ගේ ගමන් මාර්ගයන්හි සන්ධිස්ථානයක් වන උයියන්කලම් පිහිටි කඳවුරේ සිට අණදීම සිදුකරන ලදී. අණදීම භාරගත් දිනට පසු දින බලඇණියේ විමර්ශන මුරයක් මඟින් ත්‍රස්තවාදී සතුරු බංකරයක් විනාශකර ත්‍රස්තවාදීන් දෙදෙනෙකු මරා දමා ඔවුන්ගේ සගයන්ට තුවාල සිදුකිරීමට හැකියාව ලැබුණි. මේ අයුරින් රාජකාරි කරන අතරතුර ද්‍රවිඩ සිවිල් වැසියන් සමඟ සම්බන්ධතාවයෙන් පුරවැසි කමිටු පිහිටුවීමෙන් ප්‍රදේශයේ ආරක්ෂාව එමඟින්ද තහවුරු කරන ලදී.

4. මත්මන්ව පිරමනාලන්කුලම්හි ඉදිරි ආරක්ෂක වලල්ලේ ස්ථානගත මෙම බලඇණියේ අණදෙන නිළධාරී හා අනෙකුත් නිළධාරීන් ඇතුළු සෙනීන් සියල්ල සාමුහිකව එකමුතුකමින් යුතුව පැවරෙන සියළු රාජකාරි මැනවින් ඉටු කරමින් බළඇණියේ උන්නතිය සඳහා ඇපකැපවී සිටින්නෙමු. ඉදිරි අනාගතයේදී තවදුරටත් දියුණු වී සාර්ථක බළඇණියක් බවට පත්වීමට ඉඩකඩ සැලසේවායි ප්‍රාර්ථනය කරන්නෙමු.

MILITARY COMMUNICATIONS SYSTEM CHARACTERISTICS OF THE FUTURE

To meet the needs of the expected situation the system or systems need to provide.

The following :

1) Global coverage.
2) Small, cheap units, preferably handheld.
3) Secure communication ability, encrypted transequipment located in or near the headquarters. A large communications node close to tactical headquarters created serious problems. The conflicting requirements of the two roles resulted in serious difficulties in siting the headquarters complex. The sheer size of the missions, with a wide rage of compatibility, to include commercial, mixed and military standards. This should include methods of protecting against radio theft such as voice identification.
4) Automatic switching of calls. This includes intelligent selection of a path that can bypass a failed or busy link.
5) Station elimination. The ability to remotely disable a compromised raido.
6) Station grouping. The ability to select a group or radios to receive a particular transmission.
7) Bandwidth use optimization. The ability to assign bandwidth as necessary to support the tactical need of the operation. This includes the ability to trade high bandwidth video circuits for multiple voice or data circuits.
8) Routine report capability. The ability to send a short data at each transmission that updates commonly reported data such as position and unit identification.
9) Interoperability. Compatibility with multiple commercial cellular and satellite systems, to include a software update capacity to incorporate new standards.
10) Backup capacity to handle peak traffic periods.

MILITARY COMMUNICATIONS ARCHITECTURE OF THE FUTURE

Communication is vital to all levels of command, however higher levels of command have advanced communication capability while the lower levels use equipment not much different than that of fifty years ago. With the explosion of commercial information transfer ability the means to provide the lower levels of command the necessary secure communication is possible and affordable. The final architecture should be commercial hardware with limited military specifications. Such hardware is available freely. Existing equipment can be phased out in stages. New equipment should be procured to meet the ten system requirements proposed above.

The opposing view to using commercial technology is that it is not as protected as the military system. This is a myth. Careful analysis of the vulnerabilities of the capability of the enemy and the likelihood of his desire to eliminate commercial communication needs to be added to communication planning. Where it is not vulnerable, commercial communication should be used.

The new military communications architecture should be,

a) A Satellite Cellular Phone System to replace the trunk communications system.
b) A long Trunked Radio System to replace Net Radio.

A Satellite Cellular Phone System is one of the most promising capabilities on the horizon. This type of system has the satellite-borne capacity to route calls with cross satellite links and a hand-held unit that possesses the ability to connect to a local cellular system. The fielded hand-held units have a data transmission ability that could be used to send Global Positioning System derived location data along with a unit identification that would reduce the verbal communication. Because the signal is digital it is inherently harder to exploit, but adding an encryption module to the hand have the added advantage in that it uses Low Earth Orbit (LEO) satellites that require less power to use.

The command post has an additional advantage with a satellite cellular phone system in that the phone numbers do not change with location. This allows standardization of the communication plan.

Logic Trunked Radio (LTR) system is the next promising system. This utilizes a concept called trunking. This method of channel management gives all users of the system automatic access to all channels. This results in minimum waiting to make a call and the most efficient use of the available channels. Trunking is controlled by logic circuitry in the mobile and handheld transceivers and the repeaters. This circuitry continually monitors the system and generators data massages which

update the mobiles and repeaters as to which repeaters are free.

There may be over thirty users on the net of a conventional radio net, and in most cases only two can use the net at a time. Furthermore, in order for human communication to be understandable there must be spaces of silence. LTR systems if used, can allow the silences in one conversation to pass information from another conversation. The same net can allow large message to travel over multiple nets, cutting the time of transmission several fold. An additional benefit, is that the system can automatically route messages over alternate paths-without operator interaction. This system that can handle resource allocation allows the commander to rapidly shift communication assets as required by the tactical situation.

The existing military equipment can be used for the local (less than 25 miles) coordinator efforts and also to keep a backup and or can be efforts and also to keep a backup capability till such time as the confidence level of the users of the new system in built up. The existing military equipment can also be used, with augmentation, to provide the battlefield presentations at the major command posts. Commercial equipment) should be phased into use. Starting with the levels of command that lacking communication capability, yet are often those called upon to perform mission in remote regions without adequate communication ability.

The advantages of Military Communications architecture as enumerated above will be several fold, the major advantages being :

a) Less specialist Communication manpower would be required.
b) The cost of providing communications to major defence organizations could be reduced by more than half as cheap but secure civilian type of communication equipment will be used.
c) Communication efficiency would be of a very high order.
d) Communications can be made highly flexible without redeploying equipment.
e) The same type of equipment can be used by formations and units.

CONCLUSION

The existing communications system provides the robust communication necessary for a traditional battle field. Although technology advances of the last fifty years impacted the quality of battle field communication, no significant change in the structure or employment of communication networks occurred. The lack of change is indicative of a practical sense of function rather than a lack of initiative. No technology other than the change to digital technology has the ability to replace operator functions.

All prior communication methods used by the infantry units functioned on the net principle, that is, a common frequency with multiple stations. The net limitation is that a commander cannot monitor all nets without having a dedicated radio for each net. Using digital methods the limitation for a dedicated radio is lifted. With digital control the commander, with one radio, can page a particular unit or specify a group of units to receive a broadcast. Automatic functions can report position and acknowledge communications. The flexibility of a digital system is a key strength particularly for forces required to be ready for multiple missions.

Although there is experimentation with new tactics, world war II amphibious tactics are effective and still a part of doctrine, primarily because of their demonstrated effectiveness over a variety of situations. The similar experience and capability of existing communication should not be discarded but rather used as the gold standard against which new capability is measured.

Digital-controlled, commercial technology can provide the means to support the new concepts of mobile warfare, but only if applied thoughtfully with a clear vision of the vulnerabilities and the best way to implement the strengths.

Communication nets saw little change in the last fifty years because technology could not support different procedures. Now that the military's job is changing from major assaults concentrated in a small area to small units operating independently, the need to communication to these units operating independently, the need to communicate to these units is a critical vulnerability. Trunking technology provided an affordable substitute to the existing military network that supports small unit operation, without destroying the capability to conduct a large scale operation.

Maj. Gen. (Rtd) WJTK Fernando
MIEE, MIERE, MBRM, PSC

යුද්ධයේ ගිනිදැල්

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර පිලපිටියේ හේරත් බණ්ඩාර කරල්ලියද්ද සහ උඩ වලව්වේ උදේනි කුමාරි යන දෙපලගේ එකම පුත්‍ර රත්නය 71 මැයි මස පළමු වන දින මහනුවර රෝහලේ දී උපත ලත් තේජා කරලියද්දෙ බංඩාර මූලික අධ්‍යාපනය සඳහා කිරිබත්ගොඩ ශ්‍රී ස්වර්ණජෝති මහා විද්‍යාලයට පිවිසියේ 1976 දීය. පසුව උසස් අධ්‍යාපනය සඳහා පේරාදෙනිය මධ්‍යමහා විද්‍යාලයට ගොස් උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා සිටියදී අප ශ්‍රී ලංකාවෙහි යුද ගිනිදැල් බුර බුරා නැගෙද්දී 1991 දෙසැම්බර් මස 13 වන දින ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්චා බලසේනාව වෙත බැඳුනේය. ඉන් පසුව හමුදා පුහුණු මධ්‍යස්ථානය දියතලාව වෙතින් ආධුනික පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස හැදෑරීමෙන් අනතුරුව පළමුවෙනි හා දෙවෙනි ශ්‍රී ලංකා සංඥා බලකාය වෙත ඇතුළත් කරන ලදී. ඉන් අනතුරුව රාජකාරි සඳහා තුන්වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය වෙත යා කරන ලදී. එතැන් සිට තමා දිනූ දේශය රුදුරු ත්‍රස්තවාදීන්ගෙන් ආරක්ෂා කරගැනීමේ පරම පවිත්‍ර චේතනාවෙන් ලක් මවගේ වීර පුතෙකු ලෙසින් ක්‍රියා කරන ලදී. මියයන මොහොත දක්වාම ඉතා හොඳින් දක්ෂ ලෙසින් තම රාජකාරිය ඉටු කරන ලදී.

මාගේ පුතනුවන් පාසල් වියේ පටන් ඉතා දක්ෂ ක්‍රියාශීලි අයෙකි. ඔහු පාසල් සමය ගතකරද්දී පිලපිටිය ස්වර්ණහංස ක්‍රීඩා සමාජයේ ලේකම් තනතුර දරමින් ප්‍රදේශයට විශාල සේවයක් ඉටු කරන ලදී. එමෙන්ම ගම හරහා කිලෝ මීටර් දෙකක පාරක් ශ්‍රමදාන පදනම යටතේ අඩි 12 ක් පලල් කර සකස් කරන ලදී. එම පාර දැනට ප්‍රධාන පාරට යා කරන ලද බෝක්කුව ප්‍රාදේශීය සභාව මඟින් සකස් කර නොදෙන බැවින් වාහනයක් යෑමට නොහැකිව ඇත. එහෙත් පාර පමණක් පවරාගෙන ඇත. එය මියගිය කෝප්‍රල් බණ්ඩාරගේ නමින් නම්කිරීමට අවශ්‍යව ඇතත් මේ දක්වාම එය ඉටුකර ගත නොහැකිව ඇත. බණ්ඩාර පුතණුවන් තේජා අප රටෙහි යුධ ගිනි දැල් නිවා දැමීම සඳහා යුද හමුදාවට බැඳුනේය. අප රටෙහි ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය සුරැකීම උදෙසා රට ජාතිය ආරක්ෂා කිරීමේ රාජකාරියේ යෙදී සිටියදී තරුණ වියේදීම තම ජීවිතය නොසිතූ විරු අන්දමින් කොටි බෝම්බයකට ගොදුරුවීමෙන් ඔබගේ වටිනා ජීවිතය අප සැමට අහිමි විය. එම වියෝව දරාගත නොහැකිව පවුලේ මව, පියා සහ නැගනියන් දෙදෙනා මානසික රෝගීන් බවට පත්ව ඇත.

මවුපිය දෙපළට සිටි එකම පුතනුවන් රුදුරු කොටි ත්‍රස්තවාදීන්ගෙන් අප රට බේරාගැනීමට ජයසිකුරු ක්‍රියාන්විතය ඇතුළු ප්‍රධාන පෙළේ ක්‍රියාන්විත රැසකට සහභාගි වී ඇති මෙම රණවිරුවා තම අත්දැකීම් හා පළපුරුද්ද තුළින් දක්ෂ රණවිරුවෙකු ලෙස දිගු කලක් උතුරු නැගෙනහිර ක්‍රියාන්විතයේදී කරන ලද අගනා සේවය වෙනුවෙන් පූර්ණ භූමි පදක්කමද පිරිනැමීමට නිර්දේශ කර ඇත. තවද, බණ්ඩාරගේ දක්ෂතාවයද හේතුකොට ගෙන 1994.09.01 දින දී ලාන්ස් කෝප්‍රල් නිළයටද උසස් කරන ලදී.

මෙලෙස දක්ෂ රණවිරුවෙකු ලෙසින් රාජකාරියේ යෙදී සිටියදී තාන්ඩිකලම් ප්‍රහාරයේදී කොටි බෝම්බයකට ගොදුරු වීමෙන් සදහටම අප්ගෙන් වියෝවී යටිනුවර ජනතාවත්, සංඥා බලකායත්, සිරිලක සිහල ජාතියත් කඳුලින් තෙත් කළ මාගේ එකම පුතනුවන ඔබ ජීවත් වූ කෙටි කාලය ශතවර්ෂයක් ගතකළ අයෙකුට වඩා වැඩි වැඩ කොටසක් ජාතියට ඉටුකර දුන් වීර පුතෙකි.

මෙම කෙටි කාලය තුළ ඔබ දිවි පරදුවට තබා උපයාගත් මාසික වැටුප එක්කොට ඉදිරි අනාගතය උදෙසාද, වගා කිරීම සඳහාද, ඉඩම් කැබලි තුනක් ගෙන පියා වෙත පවරන ලදී. ඒ සියල්ලද මාපිය හිත මිතුරන් සියළුදෙනා අතහැර දමා අවසන් ගමන් ගියද, මේ ඔබගේ අවසාන අකල් මරණයයි. මින් මතු උපදින කිසිම ආත්මයක නිවන් දකිනා තෙක් අකල් මරණයකට ගොදුරු නොවේවා. උපන්දා සිට තම දේශයටත් ජාතියටත් දැක්වූ උපහාර සහ මවුපිය උපකාර හා උළස්ථානය හේතුකොට ගෙන මතු බුදු වන මෛත්‍රී බුදුන් දැක නිවන් දකිත්වා. මෙම ලිපිය සකස් කරන ලද කෝප්‍රල් බණ්ඩාරගේ පියා වන හේරත් බණ්ඩාර කරල්ලියද්ද වන මාගේ පැතුම වනුයේ අප ශ්‍රී ලංකාද්වීපයේ ඒකීයභාවය ආරක්ෂා කිරීමේ මහඟු සේවාවක යෙදී සිටින මාගේ විරෝධාර රණවිරු දෙවියන්ට මෙලොව රුදුරු කොටින් සමග සටන් වැදීමට යෝධ බල යෝධ වීර්යය, ශක්තිය හා සියළු දෙවියන්ගේ ආශිර්වාදය ද, ත්‍රිවිධ රත්නයේ පිහිට ආරක්ෂාව ද ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

සකස් කරන ලද්දේ
ආර්.ඩී.ඇම්.එච්.බී. කරල්ලියද්ද

සිග්නලර්...... ඔබට ජය !
මතු දියුණුට යන්නා

සිව්වන වෙළුම බිහිවන දියුණුව ජේවී
සිග්නලර් සඟරාව නව දියුණට ඒවී
එක, තුන, හතර හා ආධාර යාවී
සංඥා බලකායේ විකුමන්...... කියවාවී

අණ දෙන නිල දරුවෝ නායකයන් ගාව
නෙක - නෙක විකුම් ඇත සෙසු නිලයන් පැව
හොඳ නම රැක ගත්තේ දැඩි විනයට යාව
ඉපදුනු නිසයි හොඳ මව් පියනට දාව

සංඥා මැදිරියේ හුවමාරුවේ හිඳ
තරුවල - ගස්වලට වයරය තබා බැඳ
සෙට් එක කරව ගෙන පාබල රැගේ වැඳ
සංඥා - නම රැක්කේ එක, තුන, හතර සොඳ

බංකර් කපාගෙන රැපු නසනා දරුවෝ
ගිනි අවි තුරුලු කර තිස් පැය හෙලි කෙරුවෝ
පාබලයන්ට නොදෙවෙනි විකුමන් දැරුවෝ
පහ, හය ලංසංබ - ආධාරක විරුවෝ

ඔය වැනි විකුම් පානා සොයුරන් දන්නා
තොරතුරු සැමලියා සඟරාවට දුන්නා
සැකසුම් මඩුල දෙයි. අඩුපාඩුවක් පෙන්නා
සිග්නලර් ඔබට ජය! නව දියුණට යන්නා

සෙ/66479
සැරයන් ජයලාල් කේඑම්එස්
සි කණ්ඩායම, 6 ශ්‍රීලංසංබ (ආබ)

පන්හිඳ


ආසයි නෙ?

පාරමී පුරමු

මහ ද සසල කළ
නුඹේ සුසුම් පොද
හමා ගියා ත්‍රිලු දෙරණ පුරා
තිසල වෙලා අද
නුඹේ එනම මට
හමන පවන් සුලි සුළං වෙලා
මියදෙනා විට අපි
එකට මියෙන බව
ලොවට හඩ හා කීවෙමි
කෙසේ නම් විඳ දරා ගන්නද
හදේ නැග එන සුසුම් රැල්
සිනිඳු සුකොමල
සුසැදි සුදු අත
තිබුනෙ පෙරදා. මල් වගේ
කලුම කලූ මහ රුදුරු ගිණි අවි
රැඳුනෙ කෙලෙසද නුඹ අතේ
උපදිනා මතු යම් භවේ දී
එකට ඉපදෙමු එක කුසේ
සුසැදි බැඳි හද සෙනෙහසේ මගෙ
ගල් ගැසී ඇත හද ගැබේ
ඒ සෙනෙහෙ මල් පිපෙන්නට
පාරමී දම් පුරමු අප දෙදෙනා

අලුත්වැවේ සමිත ගිමි
බෞද්ධාලෝක විහාරය
ඇහැලේපොල, පල්ලෙපොල.

3 ශ්‍රීලංසංබ හි සේවය කරමින් සිටියදී 1999.07.19 දින මන්නාරම ප්‍රදේශයේදී මිය යන ලදී. සෙ/275142 සැරයන් කුමාරසිංහ එච්ඩීඑස් රණවිරුවා සිහිවීම පිණිස ඔහුගේ බිරිඳ විසින් ඉදිරිපත් කර ඇති නිර්මාණය.

එරබදු මල් පොට්ටු
පීදෙන්න කල් බලයි
බක් මහේ සුභ නැකත
පීදෙන්න අර අඳියි
දුකක් නොඇ නිදි සුවය ලබන සඳ
වෙඩි හඬින් කම්පා වුනු කලවැටේ
නුඹ නුවන් ඈඳුර විනිවිදියි
රුදුරු වූ ගිනි අවිය
ලඟනක තදවින ළඟ
දුන කමෙයි
බක් මහ සුව මොහොත
වැට කඩුල්ල ළඟ
එවී බලන සඳ
මයිතුරිවිමි සුළං සරක් වී
නුඹ සොයා දිග ඇදෙයි

බක් මහේ සුළං සොයිය
මා උවන සිහින සඳ
එසැනින්ම නුඹ මසිත දැලව
නොබ වැදුනි ....
දැනුනි සිත ඉමට හීන් දුකක්
දුගේ දුක් කැවුල් පීච්චය හා
පොරබැදුව ද
ත්‍රිශූල-පාර්වතී
මූර්තයට විරාමයක් ගන්න සැරසෙයි
තාරුණ්‍යම යුද්ධයට සීත්නව
මසිත් නි පීදුනු හැම බලාපොරොත්තුවක්ම
කල් අහි මුවද පරව ගොස්
නමුදු .... නොපීදුනු ද නුඹ නමින් වූ
නොවෙස් වූ සෙනෙහස
සිත් පතුලේ නිදා නොනිදා
බලා හිඳී නෙව දවසේ
කුරිරු වූ යුද්ධයට
සාමයේ රහන් සිල
දල්වෙන තුරා ....

ජයග්‍රහනයේ රහස

නව හිරු උදා විය පැහැබර සිනහ පපා
පෙරදා රැඳී තිබූ මහ ඝන අඳුර කපා
සොයුරන් පිය නැග්ගේ ඔසවා සැමගේ දෙපා
තේ පැන් බොන්න අවුරුදු දා කැවුම් හපා

අණදෙන නිළධාරී තුමනුත් හැම නිළයන්
රැස්වූ අයුරු දැක සිහිවුණි පෝ හෙලයන්
මුව පිරි සිනාවෙන් අමතා .... සෙසු නිළයන්
ඔහු කී දෙයින් ලැබුනා මා හැඟී බලයින්

අවුරුදු අසිරියෙන් රට පිබිදෙන කලට
ගම නගරයේ කරනා කටයුතු වලට
සාමය ලැබෙන්නේ හැම හදවත් තුලට
අප සිටිනා නිසයි මේ බංකර පෙලට

හැම මව්පියන් දරුවන් සැම ලක් වැසියන්
රැකුමට යුධ වැදී ඇති ඔබ - සැම විරුවන්
පියවරු දෙදෙනකුට ඔබ සැමහිමි කරුවන්
මම ඉන් එක් පියෙක් ඔබලා මගෙ දරුවන්

රට දැය රැකීමට නීතිය සාමයද
මිනිසත් බව පිරුන මා හැඟි ප්‍රේමයද
විනයෙන් ගොඩ නැගුන තම අභිමානය
තව දැඩි කරන්බොමු .... මේ තේ පානය

කිරිබත් කමින් සැම වෙත ගොස් කතාකර
සුවදුක් විචාරා විසඳුම් ලඟාකර
සුවපත් කළා සැම සිත් දුක් නසාහැර
තම නායක ගුණය සැමවෙත. බෙදාහැර

යුද්ධය දිනන්නට සෙබළගෙ කැපවීම
ලැබුමට අවැසි මයි මනසෙහි පිබිදීම
සෙසු නිළයින් සිතට වලෙසින් ලංවීම
